# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

## 17.හෝටල් / පිළිගැනීමේ ශාලා වල පවත්වන මංගල උත්සව

කොවිඩ් 19 වලට ප්‍රතිචාර වශයෙන් වර්තමාන තත්වය යටතේ ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි අමුත්තන්ගේ සංඛ්‍යාව අවම කළ යුතුය.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**පිළිගැනීමේ ශාලාවේ / හෝටල් කළමනාකරණය**

- අමුත්තන්ගේ සංඛ්‍යාව සීමා කිරීම ගැන සේවාදායකයාට සඳහන් කළ යුතුය. උත්සව ශාලාවේ පවතින ආසන ප්‍රමාණයෙන් අඩකට හෝ අඩකට වඩා අඩු පිරිසක් සහභාගී විය යුතුය (උපරිමය සියදෙනෙකුට යටත්ව).
- අසනීප බවක් දැනේ නම් උත්සව අවස්ථාවට සහභාගී නොවී සිටින ලෙස අමුත්තන්ට දැනුම් දීම සේවාදායකයාගේ වගකීමක් බව ප්‍රකාශ කල යුතුය.
- උත්සවයේ විවිධ අවස්ථාවලදී ප්‍රමාණවත් ශාරීරික දුරස්ථභාවයක් පවත්වා ගත යුතුය - පෝරුව, ලියාපදිංචිය, මේස සහ පුටු, බුෆේ ප්‍රදේශ.
- පිළිගැනීමේ ශාලාවේ ඉඩ ප්‍රමාණය මත, එකිනෙකා අතර මීටරයක දුරක් තබා ගැනීමට ඇති හැකියාව, ආසන ප්‍රමාණය සහ ඇවිදීමේ අවකාශය මත අවසර ලත් අමුත්තන් ගණන ගණනය කළ යුතුය.
- නැවුම් වාතය හුවමාරු වන ලෙස වාතාශ්‍රය වැඩි වන ලෙස ශාලාව සකසන්න. පිටතින් ප්‍රමාණවත් තරම් නැවුම් වාතය ලැබෙන ලෙස වායුසමීකරණ යන්ත්‍රයේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වය තහවුරු කරන්න.
- ආසන සැකැස්ම මීටරයක දුර ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය.
- පරිශ්‍රයට ඇතුළු වීමට පෙර අත් සේදීමේ පහසුකම් ලබා දිය යුතුය.
- ඇල්කොහොල් අඩංගු දෑත් පිරිසිදුකාරකයක් පිළිගැනීමේ ස්ථානයේ සහ ස්ථාන කිහිපයක තබා ගත හැකිය.
- බුෆේ සඳහා ඒ සඳහා වෙන් වූ කාර්යය මණ්ඩලයක් යොමු කරන්න. ස්වයං සේවා සඳහා අවසර නැත.
- උත්සව ශාලාව වෙන්කරවා ගැනීමේදී වත්මන් නීතිරීති සමඟ උපදෙස් පත්‍රිකාවක් සේවාදායකයාට ලබා දිය යුතුය.
- මුහුණු ආවරණ පැළඳීමට සියලු අමුත්තන් දිරිමත් කරන්න.
- එකිනෙකා සමඟ ආරක්ෂිත දුරක් පවත්වා ගත නොහැකි බැවින් නැටුම් අංග පැවැත්වීම සුදුසු නොවේ.
- මනාලියට හා මනාලයාට පමණක් නැටුම් අංගනයට පැමිණ නැටුම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- උපරිම පුද්ගලයින් 4 දෙනෙකුගෙන් යුත් සීමාවන් යටතේ නර්තන කණ්ඩායමකට ඉඩ දිය හැකි අතර ඔවුන්ගේ පෞද්ගලික වෛශ නිරූපණ භාණ්ඩ භාවිතා කිරීමට ඔවුන්ට උපදෙස් දිය යුතුය.
- මත්පැන් පානය කිරීමට ඉඩ නොදෙන්න.
- සෑම විවාහ මංගල්‍යයක් සඳහාම සෞඛ්‍ය ආරක්ෂක සම්බන්ධව නිලධාරියෙකු පත් කරන්න. උත්සවය සඳහා සූදානම් වීමේ දී සේවාදායකයින් සමඟ සම්බන්ධ වී ඔවුන්ව දැනුවත් කිරීමට ඔහුව දිරිමත් කරන්න.
- කොවිඩ්-19 පාලනය කිරීමේදී අනුගමනය කලයුතු පියවර පිළිබඳව උත්සවය ආරම්භයේ දී සහ අතරතුරදී නිවේදනය කරන්න.
- උත්සවය අවසන් වූ විගස ශාලාව පිරිසිදු කර විෂබීජහරණය කරන්න.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකඟතා ප්‍රකාශය පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපතක් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම ආයතනය හිමිකරුගේ / කළමනාකරුගේ වගකීම වේ.

**සේවාදායකයා සඳහා**

- උත්සව දිනට පෙර අමුත්තන්ගේ සෞඛ්‍ය තත්ත්වය තහවුරු කර ගැනීම සහ ඔවුන්ගේ පැමිණීම තහවුරු කිරීම සේවාදායකයාගේ වගකීම වේ.
- අතට අත දීම් හා සිප වැළඳගැනීම් වළක්වා ගත යුතුය.
- මිනිසුන් ගමන් කරන විට මීටරයක දුරක් තබා ගැනීමට හැකිවීම සඳහා ප්‍රමාණවත් පරතරයක් සැපයිය යුතු බව සියලු විධිවිධාන සැලකිල්ලට ගත යුතුය.
- අමුත්තන්ට මුහුණු ආවරණ පැළඳීමට දිරිගන්වන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- වැඩිදුර දැනුම් දෙන තුරු විවාහ මංගල්‍ය සඳහා අමුත්තන් ගණන සීමා කර ඇති බව රජය ප්‍රකාශ කළ යුතුය.
- වෙන්කරවා ගැනීමේදී ගනුදෙනුකරුවන්ට උපදෙස් දීමට සියලුම හෝටල් කළමනාකරුවන් කටයුතු කල යුතුය.
- වැඩිදුර දැනුම් දෙන තුරු සියලුම හෝටල් නව අනුව කටයුතු කරන බව ප්‍රදර්ශනය කල යුතුය.




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.